ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව
රත්නපුර දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 31 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 නොවැම්බර් 24 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
--------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------------

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම
---------------------------------------------------------------------

ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම් ප්‍රමිත අංක 01 හි 21 ඡේදයට අනුව මූල්‍ය ප්‍රකාශන කට්ටලය සමඟ ඉදිරිපත් කළ යුතු ගිණුම් පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශයක් ඇතුලත් සටහන් ඉදිරිපත් කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) අයශීර්ෂ 3-41 ට අදාල සමාලෝචිත වර්ෂයෙහි ආදායම රු. 313,000 ක් වශයෙන් හඳුනාගෙන තිබුණද, අදාල ලෙජර් ගිණුමෙහි එම ආදායම රු. 58,000 ක් වශයෙන් ගිණුම්ගත කර තිබුණි.

(ආ) 2010 වර්ෂයේ බදු පදනම යටතේ මිලදී ගත් රු. 6,200,000 ක වටිනා මෝටර් රථයේ ප්‍රාග්ධන වටිනාකම, වත්කම් ගිණුම හර කර ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුම බැර කරනු වෙනුවට වත්කම් ගිණුම හර කර කල්බදු සමාගම් ගිණුම බැර කර තිබූ අතර, ඊට අදාල රු. 2,798,740 ක්වූ අවිනිශ්චිත පොළිය කල්බදු සමාගම් ගිණුම බැර කිරීම මඟින් ගිණුම් වලට ගෙන නොතිබුණි.

1.3.3 නොසැසඳූ පාලන ගිණුම්
----------------------------

ගිණුම් විෂයයන් 10 කට අදාලව 2013 දෙසැම්බර් 31 දිනට පාලන ගිණුම අනුව ශේෂයන්හි එකතුව රු. 29,057,005 ක්වූ අතර, ඊට අදාල උපයෝගී ලේඛණ අනුව ශේෂයන්ගේ එකතුව රු. 20,367,728 ක් වූයෙන් වෙනස රු. 8,689,277 ක් විය. එකී වෙනසට හේතු සොයා බලා ලෙජර් ගිණුම් වලට අවශ්‍ය ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

1.3.4 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි විධිවිධාන වලට හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව. | අනුකූල නොවීම්. |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ජනරජයේ 2005 ජුනි 08 දිනැති අංක 1396/18 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ සඳහන් රීති | වෛද්‍ය වාර්තා ඉදිරිපත් නොකර රැස්වීම් වලට නොපැමිණි සභිකයින් 07 දෙනෙකු සඳහා රු. 65,000 ක දීමනා ගෙවා තිබුණි. |
| (ආ) | <u>ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය - 1992</u> | |
| (I) | මුදල් රෙගුලාසි 371(2) | 1988 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා අත්තිකාරම් ලෙස ලබා දී ඇති එකතුව රු. 3,180,527 ක මුදලක් පියවා නොතිබුණි. |
| (II) | මුදල් රෙගුලාසි 571 | 1992 සිට 2011 වර්ෂය දක්වා කාල සීමාවට අදාලව එකතුව රු. 4,637,152 ක්වූ තැන්පතු සම්බන්ධයෙන් විධිවිධාන පරිදි කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු. 10,875,311 ක් වූ අතර,ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු. 7,267,712 ක් විය.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් අතිරික්තය පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 49.6 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි. මෙයට ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ වරිපනම් හා බදු, වරෙන්තු ගාස්තු හා දඩ සහ වෙනත් ආදායම් වල වැඩිවීමයි.

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා සමුච්චිත හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. '000' | රු. '000' | රු. '000' |
| වරිපනම් හා බදු | 7,785 | 4,531 | 3,576 |
| බදු කුලී | 6,248 | 5,501 | 248 |
| බලපත්‍ර ගාස්තු | 516 | 624 | - |
| වෙනත් ආදායම් | 2,025 | 4,319 | 4,601 |

2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යය සාධනය

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත හා රැස්කල ආදායම සැසඳීමේදී වරිපනම් බදු, කුළී ආදායම හා වරෙන්තු ගාස්තු වල ඇස්තමේන්තුගත ආදායමට වඩා රැස්කල ආදායමෙහි පිළිවෙලින් සියයට 42, සියයට 12 ක් හා සියයට 66 ක අඩුවීමක් පෙන්නුම් කෙරේ.

2.3.3 වරිපනම් බදු

2013 දෙසැම්බර් 31 දිනට සභාවට අයවිය යුතු හිඟ වරිපනම් බදු මුදල රු. 3,576,000 ක් වුවද හිඟ වරිපනම් බදු අයකර ගැනීමට ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

2.3.4 බදු කුලී

කර්මාන්ත බදු, ව්‍යාපාර බදු හා වෙළඳ බලපත්‍ර ගාස්තු අයකල යුතු සභා බල ප්‍රදේශය තුල පිහිටා ඇති ව්‍යාපාර පිළිබඳ සමීක්ෂණයක් විගණිත දිනය වූ 2014 ජුනි 19 දින වනවිටද සිදුකර නොතිබුණි. ආයතනයට එකතුවන ආදායම පදනම් කරගෙන ආදායම් ලේඛණ පවත්වා තිබුණි.

2.3.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

2013 ඔක්තෝබර් මස සිට ඇඹිලිපිටිය දිසා අධිකරණය හා මහේස්ත්‍රාත් අධිකරණය මඟින් ලැබිය යුතු උසාවි දඩ මුදල් උප ලේඛණ මඟින් හඳුනාගෙන ලබා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග සිදුකර නොතිබුණි.

2.3.6 වෙනත් ආදායම්

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන මණ්ඩලයේ ලියාපදිංචි හෝටල්, නවාතැන්පලවල් වලින් අදාල වර්ෂයට පෙර වර්ෂයේ ආදායම සලකා එම ආදායමෙන් සියයට 1 ක් නොඉක්මවන ගාස්තුවක් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තියේ විධිවිධාන පරිදි අයකල යුතු වුවද, ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි එක් හෝටලයකින් එලෙස ගාස්තු අය නොකරන බව අනාවරණය විය.

2.3.7 දුරකථන කුළුණු ගාස්තු

දුරකථන කුළුණු සඳහා සම්මත ගාස්තු අයකල යුතු වුවත්, සභාව ශ්‍රී ලංකා ජනරජයේ 2009 අප්‍රේල් 17 වන දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයෙහි V වන උපලේඛණ පරිදි අදාල කිසිඳු ගාස්තු අය කිරීමක් සිදු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වන වගන්තිය අනුව ප්‍රදේශය තුල පිහිටා ඇති ග්‍රාමීය මාර්ග හඳුනා ගෙන ඒවා සභාව වෙත ගැසට් නිවේදනයක් මඟින් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. මාර්ග මායිම් විස්තර ඇතුලත් වන පරිදි සකස් කල මාර්ග ඉන්වෙන්ට්‍රියක්ද සභාව සතුව නොතිබුණි.

(ආ) ප්‍රාදේශීය සභාවේ භාවිතය සඳහා මිලදී ගනු ලැබූ රු. 181,450 ක් වටිනා ලැප්ටොප් පරිගණක 02 ක් විගණිත දිනය වූ 2014 ජූනි 19 දින සභාව සතුව නොතිබූ අතර, 2013 භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව හිටපු සභාපතිවරුන් දෙදෙනෙකු විසින් මෙම පරිගණක රැගෙන ගොස් ඇති බව අනාවරණය විය.

(ඇ) සභාව සතුව ස්ථාවර වත්කම් ලේඛණයක් පැවතියද, සභාව සතුව පවතින සියළුම ස්ථාවර වත්කම් එයට ඇතුලත්ව නොමැති බවත්, ඇතුලත් කර ඇති ස්ථාවර වත්කම් වලද ප්‍රමාණවත් හා යාවත්කාලීන තොරතුරු එම ලේඛණයේ ඇතුලත්ව නොමැති බවත් නිරීක්ෂණය විය.

(ඈ) 2013 භාණ්ඩ සමීක්ෂණයට ඉදිරිපත් නොකරන ලද භාණ්ඩ 67 ක් සම්බන්ධයෙන් කිසිඳු ක්‍රියාමාර්ගයක් විගණිත දිනය වූ 2014 ජූනි 19 දින වනවිටද ගෙන නොතිබුණි.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂ ගණනාවක සිට පැවත එන රු. 3,266,279 ක ණයහිමි ශේෂ 21 ක් සම්බන්ධයෙන් නියමිත වර්ෂ වලදී නිරවුල් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම හෝ කපාහැරීම සඳහා අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

(ආ) වීදි ලාම්පු ලේඛණයක් විධිමත් පරිදි නඩත්තු කර නොතිබුණි.

(ඇ) සභාවේ සේවයේ නියුතුව සිටි සෙවකයින් වෙත ගෙවා තිබූ එකතුව රු. 155,155 ක හිඟ ණය ශේෂයක් 2014 ජූනි 19 දින දක්වා අයකර ගෙන නොතිබුණි.

(ඈ) හිටපු සභාපතිවරයා ධූරයෙන් ඉවත්ව යාමේදී එතෙක් තමන් භාවිතා කල පීබී 9856 දරන කැබ්රථය ආපසු භාරදීමෙන් තොරව 2013 දෙසැම්බර් 05 දින සිට 2014 ජනවාරි 21 දින දක්වා දින 46 ක කාල සීමාව තුලදී කිලෝ මීටර් 3601 ක ප්‍රමාණයක් ධාවනයේ යොදවා විධිමත් අනුමැතියකින් තොරව තමා භාරයේ තබාගෙන තිබුණි. එම කාල සීමාව තුල වාහනය පෞද්ගලික භාවිතයට ගැනීම හේතුවෙන් සභාවට අයවිය යුතු අලාභය ඇස්තමේන්තු කර අයකර ගැනීමට කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

3.3 කොන්ත්‍රාත් පරිපාලනය

--------------------------

ප්‍රාදේශීය සභා ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කල තුංකම සතිපොළ වැසිකිලිය ඉදිකිරීමේ කර්මාන්තය සඳහා රු. 435,443 ක වටිනාකමින් යුත් ඇස්තමේන්තුවක් පදනම්ව මාස 03 ක කාල සීමාවක් තුල ඉටු කිරීම සඳහා "මහආර ග්‍රාමීය සමෘද්ධි සංවර්ධන සමිතිය" සමඟ රු. 420,442 ක වටිනාකමින් යුත්

ගිවිසුමකට 2013 මාර්තු 12 දින එළඹ තිබුණි. උක්ත ඇස්තමේන්තුවේ වැඩ විෂයය අංක 16 යටතේ අනුමත තත්ත්වයේ වෙදර්ෂීල්ඩ් තීන්ත දෙවරක් ආලේප කිරීම වෙනුවෙන් රු. 18,763 ක් ගෙවීම් කර තිබූ නමුත්, එකී කාර්යය සඳහා අනුමත තත්ත්වයේ තීන්ත භාවිතා කර නොමැති බවත්, එම කාර්යය විධිමත් පරිදි ඉටු කර නොමැති බවත් 2014 ජුනි 25 දින කරන ලද පරීක්ෂාවේදි අනාවරණය විය. තවද, මෙම වැසිකිලිය සඳහා ස්ථිර ජල සැපයුමක් සපයා නොතිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය
-----------------------------------------

4.1 අභ්‍යන්තර විගණනය
------------------------

1988 ප්‍රාදේශිය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 5(7) ප්‍රකාරව මූල්‍ය හා ගබඩා සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් පවත්වා නොතිබුණි.

4.2 අයවැය පාලනය
-------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 22 කට අදාලව රු. 1,844,562 ක ප්‍රතිපාදන කිසිදු කාර්යයක නොයොදවා මුළුමනින්ම ඉතිරි වී තිබුණි.

(ආ) වැය විෂයයන් 05 කට අදාලව ප්‍රතිපාදන මුදලින් සියයට 48 සිට සියයට 91 ක් දක්වා වෙනත් විෂයයන්ට මාරුකර තිබුණි.

4.3 නොවිසඳී ඇති හා පිළිතුරු නොදුන් විගණන විමසුම්
----------------------------------------------------------

හිඟ ඉන්ධන බිල්පත් වෙනුවෙන් සමූපකාර සමිතියකට ගෙවීම සඳහා 2012 වර්ෂයේ මුද්දර ගාස්තු ලැබීම් වලින් රු. 628,558 ක් ඍජුවම පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් එකී සමූපකාර සමිතියට ගෙවීම් කර තිබුණි. එම ගෙවීමට අදාල රු. 361,602 ක් ණයහිමි ලේඛණය මඟින් තහවුරු වුවද, ඉතිරි ශේෂය වූ රු. 266,956 ක් සඳහා වූ ඉන්ධන බිල්පත්, ධාවන සටහන් හෝ ණයහිමි වෙන්කිරීම් මඟින් හෝ තහවුරු නොවුණි. මේ සම්බන්ධයෙන් පසුගිය වර්ෂයේ විගණකාධිපති වාර්තාව මඟින්ද පෙන්වා දුන්නද මේ දක්වා අවශ්‍ය පැහැදිලි කිරීම් විගණනය වෙත නොලැබුණි.

5. පද්ධති හා පාලන
----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(i) ගිණුම්කරණය

(ii) අයවැය පාලනය

(iii) ආදායම් පරිපාලනය